ලලිත විස්තරය තුළ නිරූපිත බෝසත් චරිතය

**This is a Sanskrit Buddhist text of great importance. Lalitavistara which means "exhaustive narrative of the sport of the Buddha" is considered as one of the texts of the Mahayana. It is a text-book of voluminous contents. In this sacred text, the life of the Buddha on the earth is described as the diversion of a supernatural being. Although the introductory chapter begins in the manner of the pali suttas, throughout the text, the Buddha appears as an exalted divine being as in all viapulya sutras of the Mahayana tradition.**

ලලිත විස්තරය යනු පෞරාණික හීනයානික මූලාශ්‍රයක් විකසිත කොට මහායානික ආකල්පානුසාරී ව විභූෂණය කොට සංශෝධනය කරන ලද්දකි. වෛපුල්‍ය සූත්‍රයක් නමින් (elaborate teaching text) හඳුන්වන හීනයානයට අයත් යැයි මහාවස්තුවේ විස්තර වෙන මහායානික ලක්ෂණ ප්‍රකට කරන ලලිත විස්තරය මහායානික ආගමික ග්‍රන්ථයකි. මහායානික සූත්‍රයකට ආවේණික සකලාංගයන්ගෙන් ම අනූන වුවත් මෙය සර්වාස්තිවාදී බෞද්ධ සම්ප්‍රදායට අයත් බව චීන මූලාශ්‍රයන්හි පිළිගැනීමයි. කෙසේ වුවත් ආචාර්ය අශ්වඝෝෂ හිමියන්ගේ නිර්මාණයක් වන ලලිත විස්තරය බෝධිසත්ව චරිතය කියාපාන මහායාන ධර්ම ග්‍රන්ථයක් බව බහුතර ආකල්පයයි. මහායානික මත සංකල්ප උද්දීපනය කරමින් කරන ලද සංග්‍රහයක් වීම ඊට හේතුවයි.

බෝධිසත්වයන් වහන්සේ පිළිබඳ වූ ලලිතයන්ගේ - ලීලාවන්හි, ක්‍රීඩාවන්හි - විස්තරයන් මෙහි සඳහන් වේ. මෙය **ඕං නමඃ සර්වබුද්ධබෝධිසත්‍වෙභ්‍යඃ**[1] යැයි බෝධිසත්ව නමස්කාරයකින් ම අරඹයි. **සර්වබෝධිසත්ත්වානාං චොද්භාවනාථං**[2] යන උද්ධෘතයෙන් සියලු බෝධිසත්වවරුන් බුදුවරයන්ටත් වඩා උසස් කොට දක්වීමේ පරමාභිලාෂයෙන් ම මෙය රචනා කොට ඇති බව විශද වේ. මහායානික බුදුසමය තුළ බෝධිසත්ත්වයින්ට හිමි වන්නේ, සම්මා සම්බුදුරදුන් අභිභවා ගිය ඉහළ ස්ථානයකි. එම කාරණය ලලිත විස්තරය තුළ මනා ව කැපී පෙනීම, සැබැවින් ම මෙය මහායානික ආගමික ග්‍රන්ථයක් ලෙසින් හැඳින්වීමෙහිලා හේතු වී ඇත. මෙහි එන සිද්ධාර්ථ බෝසතාණන් වහන්සේගේ බෝසත් චරිතයේ පෙළ දහමේ මූලික සූත්‍ර ධර්ම තුළ එන බෝසත් චරිතයට වඩා මූලික වෙනස් ලක්ෂණ දෙකක් අපට හඳුනාගත හැකි ය.

1. මනුෂ්‍යත්වය හුවා දක්වීම වෙනුවට දේවත්වයක් ආරෝපණය කිරීම
2. බුදුවරයන්ට වඩා බෝසත් චරිතය ඉතා උසස් ලෙස නිරූපණය කොට තිබීම

ලලිත විස්තරය පුරාවට එනම් ආරම්භයේ සිට අවසානය දක්වා බෝසත් චරිතය අසීමිත භක්තියකින් අප්‍රමාණ දේව සමූහයා අතික්‍රමණය කළ චරිතයක් ලෙසින් කාව්‍යාත්මක ව වර්ණනා කොට ඇත. මහාචාර්ය ඇම්. බී. ශාස්ත්‍රී මහතා ලලිත විස්තරයට ප්‍රස්තාවනාවක් සපයමින් කරන ලද - ''මේ ලලිත විස්තරය නම් ග්‍රන්ථයෙන් තථාගතයන් වහන්සේ මනුෂ්‍යයෙකැයි සලකා ගත හැක්කේ හුදෙක් මව්පියන්, කුලය, ජාතිය, ජන්ම භූමිය ද ගැන සඳහන් කොට තිබීම නිසා මිස උන්වහන්සේ පිළිබඳ ව මනුෂ්‍යයෙකුට ගැළපෙන ක්‍රියා ගැන සඳහන් වීම නිසා නොවේ'' යන ප්‍රකාශය මෙහිලා වැදගත් සාධකයකි.

ලලිත විස්තර කතුවරයා බුදුරජාණන් වහන්සේ හා බෝසතාණන් වහන්සේ අතර එතරම් වෙනසක් නොදකී. මනුලොව ඉපැදීමක් නැතිව ම ධර්මචක්‍ර දේශනාව මහාබෝධිසත්වයන් වහන්සේට කළ හැකි ව තිබූ බව ලලිත විස්තරයෙහි සඳහන් වේ. එයින් ගම්‍ය වන්නේ බෝසතාණන් වහන්සේට බුද්ධත්වයට නොපැමිණ ම ඒ ඥානය ලද හැකි ව තිබූ බවයි. බෝසතාණන් එලෙස මනුලොවට දේවතා ස්වරූපයෙන් නොපැමිණියේ කුමක් නිසාදැයි - ''**සත්ත්වානුකම්පයාහි බොධිසත්වො මනුෂ්‍යලොකෙ උපපද්‍යතෙ න දෙවභූත එව ධර්මචක්‍රං ප්‍රවර්තයති. තත් කස්මාත්? මා බල්වානන්ද සත්ත්වාඃ කෞසීද්‍යමාපත්ස්‍යන්තෙ. දෙවභූතඃ ස භගවාන් තථාගතො අර්හන් සම්‍යක්සම්බුද්ධඃ. වයං තු මනුෂ්‍යමාත්‍රාඃ, න වයං සමර්ථාස් තත්ස්ථානං පරිපූරයිතුම් ඉති කෞසීද්‍යමාපද්‍යෙරන්** [3] - යන උද්ධෘතයෙන් අනාවරණය වේ. ඒ අනුව බෝසතාණන් වහන්සේ සත්වයන්ට අනුකම්පාව නිසා දේවත්වයෙහි ධර්ම දේශනා නොකොට මිනිස් ලොව උපදිති. ඒ කුමක් හෙයින් ද, ''ආනන්දය! සත්වයෝ කුසීත බවට නොපැමිණෙත්වා යන අදහසිනි. ඒ භාග්‍යවත් තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ දෙවි වූ සේක. අප නිකම් ම මිනිසුන් ය. අප ඒ ස්ථානය පුරවන්නට අසමර්ථ යැයි කුසීත බවට පැමිණිය හැකි ය'' යනු එහි වාච්‍යාර්ථයයි.

ලලිත විස්තර හඳුන්වා දීමේ පරිච්ඡේදයෙහි බුදුන් වහන්සේ නිරූපණය කොට ඇත්තේ ද ශ්‍රේෂ්ඨ දිව්‍යමය වූ තත්ත්වයකිනි. එහෙත් පළමු පරිච්ඡේදය ඇරඹෙන්නේ සාම්ප්‍රදායික පාලි සූත්‍රාන්ත ආරම්භය අනුව යමිනි. පාලි සූත්‍ර දේශනයේ දී සහභාගී වූ ශ්‍රාවක පිරිස ඉතා අල්ප ය. සමහර විට පන්සියයක් වූවා පමණි. ඊට අධිකතර වූ අවස්ථා විරල ය. එහෙත් ලලිත විස්තරයේ එන විස්තරයට අනුව බුදුන් වහන්සේ දොළොස් දහසක් භික්ෂූන් වට කරගෙන දෙතිස් දහසකට නොඅඩු බෝධිසත්ත්වවරුන් පිරිවරා ගෙන දිව්‍යමය රශ්මියෙන් බබළමින් වැඩ සිටියහ.

රාත්‍රියේ යථෝක්ත පිරිවර මැද දෘඪ භාවනාවෙහි නිමග්න ව වැඩ සිටින බුදු හිමියන්ගේ ශීර්ෂය තුළින් දේව සමූහයා පවා කැළඹීමට පත් කළ ආලෝක ධාරාවක් පැතිරී යයි. එකෙණෙහි ම දේවස්තුති ගීතිකාවන්ගෙන් (hymn) බුදුන් වහන්සේ පිළිබඳ වර්ණනා කරමින්, ඊශ්වර දෙවිඳු ප්‍රමුඛ සෙසු දේව සමූහයා පැමිණ බුදුන් වහන්සේගේ දෙපතුළ මුල වැටී ලෝකයාගේ මෝක්ෂය සඳහා, ආශිර්වාදය සඳහා ලලිත විස්තර නම් ශ්‍රේෂ්ඨ වෛපුල්‍ය සූත්‍රය දේශනා කරන ලෙස අයැද සිටියහ. පෙර බුදුවරු මෙන් උන්වහන්සේ ද නිහඬව ම එය පිළි ගත්හ. මෙම ප්‍රසාංගික හැඳින්වීමෙන් අනතුරුව කෘතියේ විශාල ප්‍රමාණයකින් නියම බුද්ධ චරිතය පිළිබඳ විස්ත කරන ලද පරිච්ඡේද ආරම්භ වේ. එය පාලි නිදාන කථාවල **අවිදූරෙනිදාන කථාව** පටන් ගන්නා ආකාරය සිහියට නඟයි.

බෝධිසත්වයන් වහන්සේ හර්ෂයෙන් නිබඳ පිරිපුන් තුසිත දෙව් භවනෙහි වාසය කරති. උන්වහන්සේ විසූ තුසිත දෙව් විමන පිළිබඳ විශේෂණ ගුණවාචක සහිත දිගු විස්තරයක් මෙහි හමුවේ. දෙවිවරු 84000ක බෙරහඬ මධ්‍යයෙහි උන්වහන්සේගෙන් මෝක්ෂ සාධන කාර්යාරම්භය ඇරඹීම සඳහා භූම්‍යාවර්තනය කරනු මැනවැයි ඉල්ලා සිටිති. රාජකීය පවුල් පිළිබඳ උචිතානුචිත හෙවත් පරිපූර්ණතාව හා ඌනතා පිළිබඳ දීර්ඝ මන්ත්‍රණයකින් පසු ව ශුද්ධෝදන රජුගේ දේවිය වූ මායා දේවියගේ කුස තුළ පිළිසිඳගැනීමට තීරණය කරයි. ඇය බුද්ධ මාතාවක් වීමට අවැසි සකලාංගයන්ගෙන් ම පරිපූර්ණ ව සිටියා ය. ඇය අනාගත බුදුවරු ද ස්වකීය කුසින් දැරීමට තරම් වාසනාවන්ත මෙන් ම ඇතුන් දහසකට හිමි බලය හා සාදෘශ්‍ය කාය බලයකින් ද යුක්ත ය. ඇත් පැටවෙකුගේ වේශයෙන් මව් කුසට ප්‍රවේශ වීමට බෝසතාණෝ තීරණය කළ හ. එවිට ඊට අවශ්‍ය පූර්ව කාර්ය සම්පාදනය දෙවිවරුන් අතින් සිදුවිය. දෙවිවරු මායා දේවිය සඳහා දිව්‍යමය වාසස්ථානයක් පමණක් නොව, බෝසතුන් උදෙසා ස්වර්ණමය ප්‍රාසාදයක් ද ඇගේ කුක්ෂියෙහි සැදූහ. බෝසතුන් එහි වාසය කරන කල්හි උසස් මනොඥ කාන්තිමත් ආලෝකයක් සැතපුම් ගණනාවක් දුරට පැතිරිණි. ගිලන් වූවෝ මායා දේවිය සොයා ආ අතර ඇගේ අත ඔවුන්ගේ හිස මත තැබූ පසු ඔවුනගේ සකල රෝගාබාධ එකෙණෙහි ම සමනයට පත් විය. මහාමායා

දේවිය දකුණු ඇලය දෙස බලන විට දර්ශයකින් තම පිළිබිඹු ව පෙනෙන්නා සේ බෝසතුන් දර්ශනය විය. තව ම නූපන් බෝසතාණෝ ගැබේ සිටිය දී ම යහපත් ධර්මානුශාසනාවෙන් දෙවියන් අභිනන්දයට පත් කළහ. බෝසතුන්ට උවටැන් පිණිස පූර්වාන්ත, මධ්‍යාහ්න, අපරාන්ත යන දිසා තුනෙන් ම දෙවියෝ පැමිණියහ. ලුම්බිණි සාල වනොද්‍යානයෙහි සිදුවෙන බෝධිසත්වොත්පත්තිය විස්තර කර ඇත්තේ අසාමාන්‍ය ආකාරයකිනි. මෙහි දී බෝසතුන් හඳුන්වා ඇත්තේ මහා පුරුෂයෙක් The Great Spirit ලෙසිනි. බ්‍රාහ්මණ හා උපනිෂද්වල ප්‍රජාපති (creator) පුරුෂ හා මහාපුරුෂ ලෙසින් සම්මානිත ය. එහෙත් පශ්චාත්කාලීන ව බ්‍රහ්ම හා විෂ්ණු දෙවිඳු ද එම තත්ත්වයෙන් සැලකිණි. මේ අනුව මහාපුරුෂ යනුවෙන් බෝසතුන් හැඳින්වීම පුරාවෘත්තානුගත ව විෂ්ණු දෙවිඳුගේ අවතාරයක් ලෙසින් බෝසතුන් හැඳින්වීමට නැඹුරු වූ අවස්ථාවක් ලෙසින් නිශ්චය කළ හැකි ය.

ආනන්ද තෙරුන් හා බුදුරදුන් අතර අතරමග ඇති වන සංවාද ක්‍රමික කථනයකට බාධාවක් වී ඇත. අතරමග කථාවට බාධා වන ලෙස සංවාද බහාලීම හදිසියේ සිදුවූවක් නොව අනෙක් බෝධිසත්ත්ව චරිතාපදාන මූලාශ්‍රයවලින් සුවිශේෂ වීමට දැරූ ප්‍රයත්නයක ප්‍රතිඵලයක් ලෙස සැලකිය හැකි ය. ලලිත විස්තර කතුවරයා සෑම විටෙක ම බෝධිසත්වයන් හා බැඳි සිද්ධීන් ආශ්චර්යමත් අද්භූත අයුරින් වර්ණනා කිරීමට අභිරුචියක් දක්වයි. පාළි මහාවග්ග වැනි මූලාශ්‍රයවල එන වර්ණනාවන් හා සාදෘශ්‍යතා ද ඒ අතරතුර දක්නට ලැබේ. ලලිත විස්තරයෙහි වර්ණිත බෝසත් චරිතය අද්භූත සිද්ධීන්ගෙන් ගහණ ය. බෝධිසත්වයන් ප්‍රජාපති දේවිය සමග දේවාලයට ගිය විට දේව ප්‍රතිමා පාදස්ථලයෙන් (pedestals) නැගී සිට බෝසතුන්ගේ පා මුල වැටීම පිළිබඳ පුවත අද්භූතජනක ය. බෝධිසත්වයන් පිළිබඳ හෘද්ගත භක්තිය උතුරා ගිය අවස්ථාවක් ලෙසින් මෙය සැලකිය හැකි ය. දෙපා මුල වැටුණු දේව ප්‍රතිමා යම් යම් දෙවි කෙනෙකුන්ට අයත් ද ඒ සියල්ලෙන් ම තම තම ස්වරූපය දක්වා මෙසේ කීහ.

**නො මෙරූ ගිරිරාජපර්වතවරො ජාතු නමෙ සර්ෂපෙ**
**නො වා සාගරනාගරාජනිලයො ජාතු නමෙ ගොෂ්පදෙ**
**චන්‍ද්‍රාදිත්‍ය ප්‍රභංකරා ප්‍රභකරා ඛද්‍යොතකෙ නො නමෙ**
**ප්‍රඥා පුණ්‍ය කුලොදිතො ගුණධරඃ කස්මා නමෙ දෙවතෙ**[4]

පර්වතයන්ට ශ්‍රේෂ්ඨ වූ ගිරි රාජ වූ මේරු පර්වතය කිසිදිනෙක අබ ඇටයකට නමස්කාර නොකරන්නේ ය. නා රජුන්ට වාසස්ථාන වූ සාගරය කිසිදිනෙක ගෝ කුරයෙන් සෑදුණු වළකට නමස්කාර නොකරන්නේ ය. ප්‍රභාව ඇති කරන ප්‍රභා නමැති අත් ඇති සඳ හිරු කදෝපැණියන්ට නමස්කාර නොකරන්නේ ය. ප්‍රඥාවෙන් හා පිනින් යුතු උසස් කුලයේ උපන් ගුණධාරී බෝසත්තුමා දේවතාවන්ට කෙසේ නම් නමස්කාර කරන්නේ ද? මෙහි දී බ්‍රහ්මාදි දෙවිවරුන් බෝසතුන් ඉදිරියේ අබ ඇටයකට සමාන කර දක්වා ඇත. බෝසතාණෝ මහා ගිරිරාජ පර්වතයකි. දෙවිවරු ගෝ කුර වළකි. බෝසතාණෝ මහා සාගරයකි. දෙවිවරු කදෝපැණියෝ ය. බෝසතාණෝ ඡත්‍රයා වෙති. මෙම උපමා රූපකාදිය බෝසතාණන්ට හිමි වූ ස්ථානය මනා ව ධ්වනිත කරයි.

බෝසතාණන් වහන්සේගේ ප්‍රථම පාසල් ගමන ද අද්භූත රසය ගොනු වූ ස්ථානයකි. දසදහසක් ළමයින් සමග අප්‍රමාණ විභූතියෙන් බබළමින් අට දහසක් දිව්‍ය යුවතීන් විසින් මල් ඉසින කල්හි බෝධිසත්වයෝ අධ්‍යයන ශාලාවට ප්‍රවිෂ්ට වූහ. විද්‍යාලයාධිපති විශ්වාමිත්‍ර තෙමේ බෝධිසත්වයන්ගේ හා භූම්‍යාවර්ත දේව සමූහයාගේ දිව්‍යමය වූ ප්‍රභාව දරාගත නොහැකි ව සිහිසුන් ව ඇද වැටේ. එහි දී,

**සො චිත්තධාර ජගතාං විවිධා විචිත්‍රා**
**එකක්ෂණෙන අයු ජානති ශුද්ධසත්‍වඃ**
**අදෘශ්‍යරූප රහිතස්‍ය ගතිංච වෙත්ති**

**කිං වා පුනොඵ ලපිනොක්ෂරදෘශ්‍ය රූපාං** [5]

යන උද්ධෘතයට අනුව දෙවිවරු ඔහුට සිහි එළවා, බෝධිසත්ත්වයන්ට උගත යුතු යමක් නැති බවත්, ලෝකාවර්තනය වීම පිණිස පාසලට පැමිණි බවත් පවසා ඔහුව සැනසූහ. බෝධිසත්ත්වයන් විසින් ගුරුවරයා ඇසූ, ඔහු ඉගැන්වීමට බලාපොරොත්තු වූ සියලු ශාස්ත්‍ර විද්‍යාවන්ට පිළිතුරු දී ඔහුව මවිත කරන ලදී. බෝධිසත්ත්වයන් ගුරුවරයා පවා නොදත් භාෂා පිළිබඳ ව සෙසු සිසුන් සමග ඉගෙන ගැනීමට පටන් ගත්තා ලදී. ඉගෙන ගන්නා සෑම අක්ෂරයකට ම ශ්‍රේෂ්ඨ ආප්තෝපදේශ භාෂණයක් ද, 'අ' කාරය කියවන විට ම **අනිත්‍යඃ සර්ව සංස්කාරඃ** යන්න ද, 'ක්ෂ' කාරය කියවන විට ම **ක්ෂණ පර්යන්ත අභිලාප්‍ය සර්වධර්මයාග**[6] යන්න ද උන්වහන්සේ වදාළ බව ලලිත විස්තරයෙහි සඳහන් වේ.

ලලිත විස්තරය යන වචනයෙහි පරිසමාප්ත අර්ථයෙන් ම එය කාව්‍යමය, ප්‍රශස්ති, වර්ණනා භාෂණයක් බව ප්‍රකට වේ. එකී ගුණ විශේෂය හේතුවෙන් ම ලලිත විස්තරය මිනිස් සිත ඉක්මවා ගිය බෝසතුන් පිළිබඳ පරම දිව්‍යභාවයේ පරාදීසයක් බඳු ය. ලලිත විස්තරය තුළ බෝධිසත්ත්වයන්ට මිස බුදුරජාණන් වහන්සේට යම් තැනක් හිමි වූ බවක් නොපෙනේ. එහි බෝසත් චරිතය විස්තර වන්නේ විමුක්තියෙන්, ප්‍රඥාවෙන්, වශීකෘත ගුණයෙන් බුදුවරුන් ම වැනි කෙනෙකු හැටියටයි. සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේගේ විශේෂත්වය මෙහි දී නිරස්ත වී ගොස් ඇති සෙයක් පෙනේ. **අපරිමිත බුද්ධ කොටිනයුගශතසහස්‍රපර්යුපාසිතස්‍ය** යන උද්ධෘතයෙන් බුදුවරයන් විසින් බෝධිසත්ත්වයන් ව පූජ්‍යත්වයෙන් පිදූ බව පෙනේ. එයට හේතු වශයෙන් දක්වා ඇත්තේ බෝසතාණන් වහන්සේ වූ කලි බෝධියට මුල් වූ මහා කරුණාවෙන් හටගැනීමයි.

''**බෝධිචිත්තමූලමහාකරුණාදණ්ඩාශයොද්ගතස්‍ය**'' බුදුරජාණන් වහන්සේ බෝධිය සම්‍යක් සම්බෝධිය මුල් කොට පවත්නාහ. බෝධිසත්ත්වයන් වහන්සේ වනාහි ඒ බෝධියටත් මුල් වූ මහා කරුණාවෙන් හටගන්නාහු වෙති. ඒ අනුව බුදුරජාණන් වහන්සේ කාර්යය ලෙස ගැනෙති. බෝධිසත්ත්වයන් කාරණා වශයෙන් සැලකෙති. මේ නිසා ප්‍රමාණාතික්‍රාන්ත බුදුවරුන් විසින් බෝසතාණන් වහන්සේ ව පුදනු ලැබීම අනුචිත වූවක් නොවන බව ලලිත විස්තරකර්තෘගේ ආකල්පය වූ බව පෙනේ. කෙසේ වුවත් මෙහි දී බුද්ධත්වය යනු අසාමාන්‍ය අනන්‍යසාධාරණ හුදු ගෞරව ප්‍රතිපත්තියක් වැනි සංකල්පයක් ලෙස අශ්වඝෝෂ හිමියන් ලලිත විස්තරයෙන් මතු කරන බව පෙනේ. මෙහි එන 19 වන බෝධිමණ්ඩ ගමන හා මීළඟ බෝධිමණ්ඩ ව්‍යූහ පරිවර්තයන්හි අනාගතාර්ථය විමර්ශනයට භාජනය කිරීමෙන් බෝසතුන්ගේ ප්‍රමාණාතික්‍රාන්ත ගුණ සන්තතිය උත්කර්ෂවත් ආකාරයෙන් වර්ණනා කොට ඇති බව විශද වේ.

ලලිත විස්තරය සැබැවින් ම බෝසත් චරිතය පිළිබඳ තවත් එක් මහාකාව්‍යයක් නොවේ. එහෙත් එහිලා අවශ්‍ය සෑම අංකුරයකින් ම සුසැඳුණකි. කතුවරයා පොදුවේ කෘතිය පුරා ම වාර්තාගත දේශනා විලාසයෙන් බැහැර වේ. බෝසතුන් පිළිබඳ භක්තියේ ප්‍රතිපෝෂණය ඇති කිරීමට සමත් සහෘදයාගේ හෘදයාහ්ලාදය කුළු ගැන්වෙන සාලංකෘත කාව්‍යෝපක්‍රම රැසක් අශ්වඝෝෂ හිමියන් ස්වකීය වර්ණනා ජාලයට හසුකර ගෙන තිබේ. ලලිත විස්තරය කාව්‍යාත්මක ගුණයෙන් පිරිපුන් ය. එමෙන් ම මහා බෝධිසත්ත්වයන් පිළිබඳ සම්‍යක් සම්බුදුරදුන් ඉක්මවා ගිය ප්‍රශස්ති භාෂණයකින් ද අලංකෘත ව ඇත. කාව්‍යාත්මක පද සංකලනයෙන් අවිච්ඡින්න ව ගලා ගිය බෝසතුන් පිළිබඳ හදවතේ උපන් අකලඞ්ක භක්තිය, ප්‍රශස්ති භාෂණයක් ලෙසින් විකසිත ව ඇත. බෝධිසත්ත්වයන් පිළිබඳ අපරිමිත භක්තියෙන් ඔද වැඩී ගිය මනුෂ්‍ය, දේව, යක්ෂ, නාග ආදි නේක විධ සත්ත්වයන්ගේ මුවට නගන පද්‍යයන් ද, ගද්‍ය පාඨ ද කාව්‍යාත්මක ගුණයෙන් පෝෂිත ව ඇත. කතුවරයා ස්වකීය හද ගැබේ උපදින බෝසතුන් පිළිබඳ අපරිමිත භක්තිය මෙලෙස විවිධ සත්ත්වයන්ගේ මුවට ආකස්මික ව නැගුණු අයුරින් දක්වා තිබීම කෘතියේ ප්‍රශස්ත බවට ද හේතු වී ඇත. නෛසර්ගික කාව්‍ය ශක්තියෙන් ගද්‍ය හා පද්‍ය සංකලනයෙන් බෝසතුන්

පිළිබඳ ගැයෙන භක්තිපූර්වක ප්‍රශස්ති භාෂණය, සහෘදයාගේ හෘද ඵලකයෙහි ජීවමාන බෝසතුන් මූර්තිමත් කිරීමට තරම් සමත් සජීවී ගුණයෙන් පරිපූර්ණ ව ඇත. ලලිත විස්තරය තුළ දිගහැරෙන බෝධිසත්වයන් පිළිබඳ කාව්‍යාත්මක වූ ප්‍රශස්ති භාෂණය පිළිබඳ අධ්‍යයනයේ දී **බෝධිමණ්ඩ ගමන** හා **බෝධිමණ්ඩ ව්‍යූහ** යන පරිවර්තනද්වය කදිම මූලාශ්‍රයයෝ වෙති. ඒවා තුළින් බෝධිසත්ව චරිතය පිළිබඳ කාව්‍යමය ප්‍රශස්තියක් ඉස්මතු වේ. ඒ පිළිබඳ අධ්‍යයනය පහත සඳහන් පරිදි අදියර කීපයක් ඔස්සේ සාකච්ඡා කළ හැකි ය.

- නේරඤ්ජනා නදී තෙර සිට බොධිද්‍රුමරාජමූලය කරා අභිමුඛ වූ මහා බෝධිසත්වයන්ගේ පෞරුෂපූර්ණ ගමන් විලාශය.
- අනේකප්‍රකාර දිව්‍යපුත්‍ර සමූහයා විසින් නිර්මිත කළ මාර්ගය, එහි විසිතුරු සැරසිලි හා ඔවුන්ගේ පූජෝපහාර.
- සහම්පති මහා බ්‍රහ්මයා පිරිස අමතා කරන බෝධිසත්ව ප්‍රශස්තිය.
- වසවර්ති මහා බ්‍රහ්මයාගේ ගාථා ගායනය.
- බෝධිමණ්ඩ පරිපාලක දිව්‍ය සමූහයාගේ අපූර්ව නිර්මිතයන්.
- මහාපුරුෂ ලක්ෂණයන්ගෙන් සමලංකෘත වූ බෝසතුන්ගේ ශරීරයෙන් විස්තෘත රශ්මි ප්‍රභාජාලාව.
- කාලික මහා නාගරාජයාගේ ගාථා ගායනය.
- කාලික නාරජුගේ අග්‍රමහේෂිකාව වූ සුවර්ණප්‍රභාසා කළ ගාථා ගායනාව.
- ස්වස්තික යාවසිකයා වෙත මුඛපද්මය විවර කළ බෝසතුන්ගේ සුමිහිරි වාග්මාලාවේ ආනුභාවය.
- බෝධිමූලයේ දී තණ ඇතිරිය මත පළක් බැඳ බෝසතුන් හිඳ ගැනීම.

**බෝධිමණ්ඩ ගමන පරිවර්තය තුළ බෝසත් චරිත නිරූපණය**

**ඉති හි භික්ෂවො බෝධිසත්වො නද්‍යාං නෛරඤ්ජනායාං ස්නාත්වා ච භුක්ත්වා...**[7] යනාදි පරිදි නේරඤ්ජනා නදියෙන් නා වළඳන බෝසතාණෝ මහාපුරුෂ පෞරුෂයකින් මහාබෝධිද්‍රුමය කරා පිටත්ව ගියහ. එය සොළොස් ආකාරයකින් පරිපූර්ණ වූ ගමන් විලාශයකි. බෝධිසත්වයන් පිළිබඳ භක්තියෙන් නැමුණු හදින් නැගී ආ චේෂ්ටාවන්හි උත්කෘෂ්ටතම අවස්ථාවේ ස්පර්ශය මේ වර්ණනාව පුරා දක්නට ලැබේ. සාංසාරික පාරමිතා පූරණයෙන් හිමි කරගත් අසීමිත බල පරාක්‍රමය, තේජස, මහා පෞරුෂය පදයක් පදයක් පාසා පාඨක හදේ ස්ථාවර කිරීමට තරම් ප්‍රබල ප්‍රාණවත් බවකින්, ඒ සෑම විවරණ පාඨයක් ම අනූන ව ඇත. එබිතර ප්‍රතාපත් ගුණය මෙන් ම, දයාද්‍ර කරුණාවාසිත ගුණයන්හි ඒකාත්මික වීම තුළින් බෝධිසත්වයන් පිළිබඳ බාහිර මෙන් ම ආධ්‍යාත්මික වූ ද ප්‍රශස්ති භාෂණයක් මින් පළ වෙයි.

**සිංහගතිඃ හංසරාජගතිර්නාගරාජගතිර්නාරායණගතිඃ ධරණී තලාසංසෘෂ්ටගතිඃ ශෛලරාජ සංඝටනගතිඃ විමලපද්ම ක්‍රමනික්ෂිපණ ගතිඃ, ශක්‍ර බ්‍රහ්ම මහෙශ්වර ලොකපාලාභිභවගතිඃ** [8] යනාදි පරිදි උත්තුංග ගිරි ශිඛරයක් මතින් කඩා හැලෙන රිදී වර්ණ සීතල දිය ධාරාවක් සේ උචිත ස්ථානයන්හි ම තැන්පත් වූ වාග්මාලාවකින් බෝසතුන්ගේ ගමන් විලාශය වර්ණනා කරයි. යථෝක්ත ගමන් විලාශය තුළින් බෝසතුන්ගේ ගුණ මහිමය වර්ණනාවට ලක් කරන්නේ කාව්‍යාත්මක බසකිනි. සංස්කෘත ගද්‍ය කාව්‍යයක මනොඥ චරිත වර්ණනාවන් මෙහි දී සිහිපත් වේ. වචනය සතු අර්ථවත්භාවය අර්ථ රසය ජනනය කරවයි. **සර්වාපාය දුර්ගති පිථිතගතිඃ, සර්වසත්ත්වසුඛසංජනනගතිඃ, මොක්ෂපථ සංදර්ශනගතිඃ, මාරබලාබලකරණගතිඃ, තමඃපටලක්ලෙශවිධමනගතිඃ, සංසාර පක්ෂාපක්ෂකරණගතිඃ,**

**සර්වඥඥානාභිගමනගතිඃ, ජරාමරණප්‍රශමනගතිඃ, ශිවවිරජාමලාභය නිර්වාණ පුරගමනගතිඃ**[9] යනාදි උද්ධෘතයන් මෙහිලා නිදසුන් වේ.

කතුවරයා බෝසතුන්ගේ ගමන් විලාශ වර්ණනාව තුළින් බ්‍රහ්ම, විෂ්ණු, ඊශ්වරාදි ත්‍රිමූර්තිය මූලාසනය කරගත්, සමස්ත ලෝක සභාවේ, සමස්ත දේව ප්‍රජාවේ අසහාය ස්වාමිත්වය බෝසතුන් විෂයෙහි මූර්තිමත් කිරීමට උත්සුක වෙයි. **නාරායණගතිඃ, ශක්‍රබ්‍රහ්ම මහේශ්වර ලොකපාලාභිභවගතිඃ**[10] යනාදි උද්ධෘත ඒ බව සනාථ කරයි. සමස්ත දේව ප්‍රජාවේ අසාමාන්‍ය තේජස හකුළුවා බොසතුන් තුළ ස්ථාපනය කර ඇති බව මේ අනුව පැහැදිලි වේ. එහිලා කතුවරයා භාවිත කරන්නේ වාර්තා භාෂණයක් නොව සජීවී බවින් පිරිපුන් කාව්‍යාත්මක වාග්මාලාවක් වීම ද විශේෂ ලක්ෂණයකි.

**අජිහ්මගතිඃ, අකුටිලගතිඃ, අනුපද්‍රැතගතිඃ, අවිලම්බිතගතිඃ, අලුඩිතගතිඃ, අසංඛලිතගතිඃ, අසංඝට්ටිතගතිඃ, අලීනගතිඃ, අචපලගතිඃ**[11] යනාදි තන්හි අනුප්‍රාස භාවිතය මගින් කළ ශබ්ද රසොද්දීපනය ද දක්නට ලැබේ. කාව්‍ය යනු ශබ්ද හා අර්ථ යන රසද්වයෙන් අනූන වූ වාක්‍යයයි. (ශබ්දාර්ථ සහිතෞ වාක්‍යම් කාව්‍යම්) තත් ලක්ෂණෝපලක්ෂිත පදමාලාව මගින් බෝධිසත්වයන් සතු සැබෑ ගුණ මහිමය මහත් භක්තියෙන් මෙහි දී වර්ණනා කරයි.

පෘථිවීශ්වරයන්ගේ ගුණ කථනය ගායනා කළ වන්දිභට්ටයෝ ඇති නැති දෙපක්ෂය ම සම කක්ෂයෙහිලා වර්ණනා කළහ. බොහෝ විට නැති ගුණ ම අතිශයොක්තියෙන් වැනූහ. එහෙත් මෙහි දී එබඳු සාටෝප ප්‍රශස්ති භාෂණයක් හමු නොවේ. බෝධිසත්වවරයෙකු සතු අව්‍යාජ වූ පෞරුෂය ඉස්මතු කෙරෙන කාව්‍යාත්මක ප්‍රශස්තියකින් ම මෙම 19 වැනි පරිච්ඡේදය අලංකෘත ව ඇත.

මේ ගමන බෝධිසත්වයන් මාර පරාජය කරනු වස් යන ගමනක් හෙයින්, බෝධිසත්වයන් සතු බල පරාක්‍රමය ඇති ඉහළින් පැවසූ තරමට චරිතයෙහි උත්කෘෂ්ටභාවය ද සුරක්ෂිත වේ. මාරයා පරදනු සඳහා අවශ්‍ය සකලාංගයෙන් ම බෝධිසත්වයන් සුපෝෂිත වූ බව තහවුරු කිරීම ද මේ භාෂණයෙන් අපේක්ෂා කරන්නට ඇත. ලෞකික සංස්කෘත කාව්‍ය සාහිත්‍ය තුළ හමුවන මහාකාව්‍යයන්හි නායකයා පිළිබඳ මෙන් ම ඔහුගේ විරුද්ධවාදියා පිළිබඳ බලපරාක්‍රම වර්ණනාව ද ඉහළින් සිදු කිරීම පොදු හෙවත් සාධාරණ ලක්ෂණයකි. ඉන් ඔහු ව පරදන කථානායකයාගේ ම ශ්‍රේෂ්ඨත්වය කදිමට ඉස්මතු ව ස්ථාවර වීම ඊට හේතුවයි. එබඳු අපේක්ෂාවක් ද ලලිතවිස්තර කර්තෘ හදවතේ තිබූ බව ප්‍රස්තුත පාඨාධ්‍යයනයෙන් ප්‍රත්‍යක්ෂ වේ.

ගද්‍යයෙහි ජීවය සමාස ලෙසින් අලංකාරිකයෝ (**එතද් ගද්‍යස්‍ය ජීවිතම්**) සලකති. මෙහි ද සමාස භාවිත ව ඇත. එහෙත් ඒවා තේරුම් ගැනීමට අපහසු නොවන සරල පද ගටනාවකින් ගෙතු ඒවා වෙති. බෝසත්වරයාගේ ගතිය හෙවත් ගමන් විලාශය සඳහා ඒ සෑම පද වැලක් ම විශේෂණ ලෙසින් ඔබ්බවා ඇත. මේ අන්දමින් බෝධිමණ්ඩ ගමන ආරම්භක පරිච්ඡේදය සම්භාව්‍ය ගද්‍යකාව්‍ය සිහිපත් කරවන බෝධිසත්වයන් පිළිබඳ භක්තියෙන් ලියූ සාර්ථක කාව්‍යාත්මක ප්‍රශස්තියක් වශයෙන් හැඳින්විය හැකි ය.

තේජෝ බලපරාක්‍රමෝපලක්ෂිත සොළොස් අයුරකින් සාලංකෘත බෝධිසත්වයන්ගේ ගමන් කිරීම සදෙවක, සජීවී, අජීවී සමස්ත ලෝකයා අපේක්ෂා කළ අයුරු හා පිළිගත් අයුරු ඉක්බිති ව වර්ණනා වේ.

**සුවර්ණවාලිකාසංස්තෘතා, උත්පලපද්මකුමුදපුණ්ඩරීක සඤ්ඡන්නා රත්නවේදිකා පරිවෘතා වෛඩූර්ය මණිරත්නසොපාන ප්‍රත්‍යුප්තාඃ ආඩිබලාකාහංස චක්‍රවාක මයූරොපකූජිතාඃ**[12] යනුවෙන් ඒ වග චිත්‍රණය කරයි. සරල, සුගම භාෂා ශෛලිය කෙටි වාක්‍ය රටාවට අන්තර්ගත කොට තිබීම ඉදිරිපත් කරන ප්‍රස්තුතය විසිතුරු කරවීමට තරම් සමත් ව ඇත. **රසෙ සාරඃ චමත්කාරඃ** යන අලංකාරික විග්‍රහය අර්ථ

ගන්වන අතර ඇතැම් සිද්ධි නිරූපණය කිරීමේ දී අද්භූතාත්මක බවක් රැඳුන ද චමත්කාරජනක අයුරින් විස්තර කොට තිබේ.

**වාතබලාහකෛර් දෙවපුත්‍රෛඃ සංමෘෂ්ටමභූත්, වර්ෂාබලාහකෛර් දෙවපුත්‍රෛර්ගන්ධොදකෙන සික්තමභූත් පුෂ්පෛපශ්චාවකීර්ණමභූත්** [13]

සුළඟ මෙන් ම වර්ෂාව ද මෙහි ක්‍රියාත්මක වන්නේ දෙවියන් මෙනි. ස්වභාවික පාරිසරික ස්වභාවයන් පවා දේවත්වයට නගා මෙලෙස ගායනා කරන්නේ බෝසත් ගුණ කදම්බයේ මහිමයමයි. ත්‍රිසහාස්‍ර මහාසහස්‍ර ලෝක ධාතුවේ එක ම, අසහාය ශූරයා වූ සර්ව ලෝක පූජිත බෝසතුන් උදෙසා විසිතුරු කළ මාර්ගයෙහි සුවඳ දිය ඉසීම, සුවඳ මල් විසිරුවීමාදි ගෞරවාන්විත ක්‍රියාවල දෙවිවරු නිරත ව සිටිති. බෝධිසත්වයන්ගේ ප්‍රතාපවත් අලෞකික ගුණ සන්තතිය අබියස සමස්ත පරිසර පද්ධතිය, ඔකඳ ව, විකසිත ව ස්වකීය භක්ති ප්‍රණාමය පුද දුන් අයුරු මේ පරිච්ඡේදයෙහි විස්තර වේ. බෝධිසත්වයන් පිළිබඳ අපූර්ව ප්‍රශස්ති ගුණ පූර්වක කාව්‍යාත්මක වූ කවි සංකල්පනාවෙන් පාඨක හද උතුරා යන්නේ කතුවරයාගේ කාව්‍යාත්මක වූ අර්ථපූර්ණ රසවත් යෙදුම් නිසාවෙනි.

**යාවදෙව ත්‍රිසාහස්‍ර මහාසාහස්‍ර ලොකධාතෞ වෘක්ෂාස්තෙ සර්වෙ යෙන බොධි මණ්ඩස්තෙනාභිනතාග්‍රා අභූවන්.**[14]

''**ත්‍රිසාහස්‍ර මහාසහස්‍ර ලෝකධාතුවේ යම්තාක් ගස් ඇත්නම් ඒ සියල්ල ම බෝ මැඩ වෙතට නැමුණු අග ඇත්තාහු වූහ**'' යන විවරණය බෝධිසත්වයන්ගේ ආනුභාවය හමුවේ මිනිස් ලොව පමණක් නොව දිව්‍යලෝකයන්හි දෙවියන් පමණක් නොව වෘක්ෂලතා ද සලිත ව භක්ති ප්‍රණාමයෙන් නැමී ගිය අයුරු විස්තර කෙරේ.

**යෙපි ච තදහොජාතබාලදාරිකාස්තේපි බොධිමණ්ඩශීර්ෂකා ස්වපන්ති ස්ම**[15] යන යෙදුම උසස් කාව්‍ය සංකල්පනාවකි. එදා උපන් ළදරියෝ පවා බෝමැඩ දෙසට ඉසලා හොත්තාහ. ඉන්පසු ව කෙරෙන පර්වත රාජයන්ගේ වන්දනාව හා දේව සමූහයා නිර්මාණය කළ අලංකාර මාර්ගය පිළිබඳ වැනුම් අතිශයෝක්තියට නැඹුරු වී ගොස් ඇත. සමස්ත දේව කුල පරම්පරාව ම බෝධිසත්ව ගුණ ප්‍රතිභාව හමුවේ වැඳ වැටී ස්වකීය හෘදජ භක්තිය හා ගෞරවය පුද දුන් අයුරු එහි විස්තර වේ. **තඤ්ච මාර්ගමශීත්‍යප්සරඃ සහස්‍රාණි මුක්ත කුසුමෛරභ්‍යවකිරන්ති ස්ම අශීත්‍යප්සරඃ සහස්‍රාණි ගන්ධොදකෙන සිඤ්චන්ති ස්ම. දිව්‍යෛර්ගන්ධවද්භිඃ**[16] අසූදහසක්, අසූදහසක් බැගින් වූ දිව්‍ය අප්සරාවන්ගේ මධුර දිව්‍ය සංගීත වාදන මධ්‍යයෙහි සිදුවෙන මේ පූජෝපහාර බෝසතාණන් උදෙසා ම ය. සියදහස් ගණන් බෙර වැයෙන කල්හි, ගිරා, සැළලිහිණ, හංස, කොවුල්, මොණර පක්ෂීන් නාද දෙන කල්හි දෙවියන් විසින් නිර්මිත ස්වර්ණමය වූ මාර්ගය ඔස්සේ බෝසතාණෝ බොමැඩට සම්ප්‍රාප්ත වූහ.

ලලිත විස්තර කතුවරයා බුදු මුවින් යථෝක්ත බෝධිසත්ව ගුණ ප්‍රශස්ති භාෂණය පිළිබඳ කාව්‍යාත්මක වර්ණනාවන් සිදු කරයි. මුල් පෙළ පොත්හි මෙබඳු අතිශයෝක්තිය පිරුණු වර්ණනා හමු නොවේ. එහෙත් පසුකාලීන ව වැඩී ගිය බෞද්ධ සාහිත්‍යයෙහි මෙන් ම, ඒ ආශ්‍රිත ව බිහි වූ කලා මාධ්‍යයන්හි ද මෙබඳු වර්ණනාවන් සුලභ ව දැකිය හැකි ය. ඒවා කාලීන අවශ්‍යතාව මත නිර්මාණය වූ ඒවා ය. ලලිත විස්තරය ද සර්වාස්තිවාදී ගුරුකුලයට අයත් වුවත් මෙහි මහායානික ආභාසය තදින් ම දක්නට ලැබේ. මහායානික සම්ප්‍රදාය තුළ බුදුන් වහන්සේවත් අභිභවා ගිය උත්තරීතර ස්ථානයක් බෝධිසත්වයන්ට හිමි කර දෙයි. පාළි ත්‍රිපිටකයෙහි වනාහි බුදුරජාණන් වහන්සේ හා බෝධිසත්වයන් අතර වෙනසක් තිබේ. එහි බෝසත්වරු බුදුවරයන්ට වඩා උසස් නොවෙති. ලලිත විස්තරයට අනුව බෝධිසත්ව අවස්ථාවේ දී ම උන්වහන්සේ බුදුවරයන් විසින් පුදනු ලද්දාහු ය. (**අපරිමිත**

බුද්ධකොටිනයුතශතසහස්‍රපර්යුපාසිතස්‍ය). මේ අනුව ලලිත විස්තර කර්තෘවරයා කාව්‍යාත්මක සංකල්පනා ඔස්සේ හැකි උපරිම අයුරින් බෝධිසත්වයන් පිළිබඳ ප්‍රශස්ති භාෂණයක නියැලෙන බව පෙනේ.

**එෂ ස බොධිසත්ත්වො මහා සත්ත්වො මහාසන්නාහ සන්නද්ධො...**[17] යනාදි පරිදි සහම්පති මහා බ්‍රහ්මයා බෝසතුන් පිළිබඳ ප්‍රශස්ති භාෂණය අරඹයි. එහි දී **සර්වබොධිසත්ත්වචර්යාසු නිර්ජාතඃ, සර්වපාරමිතාසු පාරංගත සර්වබොධිසත්ත්ව භූමිෂු වශිතාප්‍රාප්තඃ**[18] ආදි නයින් බෝධිසත්වයන් හැම අතින් ම හිමිකර ගෙන තිබූ පරිපූර්ණත්වය විස්තර කරයි. සහම්පති මහා බ්‍රහ්මයා කරන බෝසතුන් පිළිබඳ ප්‍රශස්තිය තුළ අගනා උපමා භාවිතයක් දක්නට ලැබේ. ඒ තුළින් බෝධිසත්වයන් පිළිබඳ සොඳුරු වූ හැඟීමක් උපදී. ඒ තරමට ඒවා කාව්‍යාත්මක ගුණයෙන් පිරිපුන් ය. එමෙන් ම ඒවා ධර්මානුකූල බවින් ද නොගිලිහුණේ වෙයි.

**සර්වධර්මභෛෂජ්‍යසමුදානීතඃ මහා වෛද්‍යරාජො, විමුක්ති පට්ටාබද්ධො මහාධර්මරාජඃ අෂ්ටලොක ධර්මානුපලිප්තඃ මහාපද්මභූතඃ ස්වචද්‍රිපිත විමල බුද්ධිර් මහාමණිරත්නභූතඃ...**[19] මේ බුද්ධාංකුරය මහා වෛද්‍ය රාජයෙකි. (සත්හට වන බව දුකට වෙදාණන්) විමුක්තිය නමැති කිරුළු පැළඳී රාජොත්තමයෙකි. මෙහි දී කවියා **අනෞචිත්‍යාධෘතෙ නාන්‍යද් රසභංගස්‍ය කාරණම්** යන්න පිළිබඳ මනා අනුභූත්‍යාවබෝධයකින් යුක්ත ව, බෝසතුන් අෂ්ටලෝක ධර්මය නොගැවුණු පියුමක් බව අවධාරණය කරයි. ලලිත විස්තර කතුවරයා අසීමිත බුද්ධ ගෞරවයකින් යුක්ත ව, බෝසත් චරිතය දෙස බලා ඇත. බුදු කෙනෙකු අභිභවනය කරන ගුණ ධර්ම බෝසතුන් තුළ පවතින බව රචකයාගේ අදහසයි. මෙතරම් ප්‍රශස්ති පූර්වක වර්ණනා භාෂණයක් වෙනත් කිසිදු සාහිත්‍ය කෘතියක නැති තරම් මෙහි යථෝක්ත ප්‍රස්තුතයන් අද්විතීය වේ.

(රීතිරාත්මා කාව්‍යස්‍ය, විශිෂ්ටා පදරචනා රීතිඃ) කවියේ ආත්මය රීතියයි. ස්වකීය නිර්මාණයේ කාව්‍යාත්මක ගුණාංගය ඉස්මතු කොට දක්වීමේ අභිප්‍රායෙන් යුක්ත වූ ලලිත විස්තර කතුවරයා සුලලිත පද සංඝටනාවකින් සමන්විත වූ රීතියක් අනුගමනය කර ඇත. සහම්පතී මහා බ්‍රහ්මයා බෝසතුන් පිළිබඳ කරන ගුණ ගායනය ශබ්දාර්ථ රසද්වයෙන් ද සුපෝෂිත වූවකි. සෞන්දර්යාත්මක මෙන් ම ධර්මානුකූල වූ ද අර්ථවත් සංකල්පනාවන් රාශියක් ඔහුගේ බෝධිසත්ව ප්‍රශස්තියෙන් උද්දීපනය වේ.

**වසවර්ති මාරයා බෝසතුන් දුටු අයුරු**

බෝසතුන්ගේ ධර්ම ඓශ්වර්යයෙහි වශීකෘත වන වසවර්ති මාරයා බෝසතුන් පිළිබඳ මෙසේ කියයි.

**රාජාසෞ ත්‍රිසහසරි ඊශ්වරවරො ධර්මෙශ්වරඃ පාර්ථිවඃ**
**ශක්‍ර බ්‍රහ්මපුරෙ ච චන්‍ද්‍රසූර්යෙ නාස්ත්‍යස්‍ය කශ්චිත් සමඃ**
**යස්‍යා ජායත ක්ෂේත්‍රකොටිනයුතා සංකම්පිතා ෂඩ්විධා**
**සෛෂෝද්‍ය ව්‍රජතෙ මහාද්‍රුමවරං මාරස්‍ය ජෙතුං චමූන්** [20]

''ත්‍රිසාහස්වර ලෝක ධාතුවේ රජ වූ හෙතෙම ඊශ්වරයා ය. ධර්මේශ්වරයා ය. පෘථිවීශ්වරයා ය. ශක්‍ර බ්‍රහ්මපුරයේ හෝ චන්ද්‍ර සූර්යයන් අතර මෙතුමන්ට සම කිසිවෙක් නැත. උපදිද්දී ෂඩ්විධ වූ කෝටිනයුත සංඛ්‍යාත බුද්ධ ක්ෂේත්‍රයෝ කම්පන වූහු ද ඒ මේ බෝසත් තෙම මාර සේනාවන් දිනන්ට උතුම් බෝමැඩ මුලට වැඩම කරති'' යනුවෙන් බෝධිසත්වයන් අසම වූ උත්තරීතර පුද්ගලයෙකු බවට පත් කරයි. තිදෙස පුරෙන්‍දවරුන් පවා අභිභවා ගිය ඊශ්වරභාවයක් බෝධිසත්වයන් සතු ය. මෙහි දී බෝසතුන්ට වඩා උතුම් ශ්‍රේෂ්ඨ කෙනෙක් ලොව නැති බව කීමෙන්, සම්බුදුරදුන්ගේ අසහාය බුද්ධත්වය

පවා නිරස්ත වී ගිය බවක් ඉස්මතු වේ. මේ වග වසවර්ති මාරයාගේ ම මුවට නඟා තිබීම ද අවධානය යොමු කළ යුත්තකි.

**මූර්ධනං යස්‍ය න ශස්‍යමීක්ෂිතුමිහ බ්‍රහ්මාලයෙපි ස්ථිතෛඃ**
**කායො යස්‍ය වරාග්‍රලක්ෂණධරො ද්වාත්‍රිංශතාලංකෘතඃ**
**වාග්‍යස්‍යෙහ මනොඥවල්ගුමධුරා බ්‍රහ්මස්වරා සුස්වරා**
**චිත්තං යස්‍ය ප්‍රශාන්ත දොෂරහිතං ගච්ඡාම තත්පූජනෙ** [21]

බඹලොව සිට ද යමෙකුගේ මුදුනත බැලිය නොහැකි ද, දෙතිස් මහා පුරුෂ ලක්ෂණෝපලක්ෂිත අග්‍ර කායක් දරන්නේ යමෙක් ද, මනොඥ වූ ද, වල්ගු වූ ද, මිහිරි වූ ද බ්‍රහ්මයාගේ වැනි හඬින් යුක්ත වූ යමෙක් වේ ද ඒ මේ බෝසත් මහසත්වරයා ය. ඔවුන් පිදීම සඳහා යමු. මෙලෙස භෞතික ශරීරය පිළිබඳ ව මෙන් ම ව්‍යංගයෙන් ආධ්‍යාත්මික ශරීරය පිළිබඳ ව ද ගුණ කථනයක වසවර්ති මාරයා නියැලෙයි. මහා පුරුෂයකු සතු වීරවික්‍රමාන්විත කාර්ය සාධනය පමණක් නොව ශාරීරික උත්කෘෂ්ට භාවයත්, ප්‍රසන්නාවහ ගුණයන් පිළිබඳ වර්ණනාව ප්‍රශස්තියක අනිවාර්යයෙන් ම ඇතුළත් විය යුතු ය. එලෙස කරන ගුණකථනය පිරිපුන් වනු පමණක් නොව කාව්‍යාත්මක ලක්ෂණවලින් අනූන වූ තරමට හෘදයානන්දජනක ද වේ. ඒ සෑම කරුණකින් ම යථෝක්ත ප්‍රශස්ති භාෂණ පූර්වක ශ්ලෝකයන් පරිපූර්ණ ව ඇත.

**යෙෂාං වා මති බ්‍රහ්මශක්‍රභවනෙ නිත්‍යං සුඛං ක්ෂෙපිතුං**
**අථවා සර්වකිලෙශ බන්ධනලතාං ඡෙත්තුං හි තාං ජාලිනීං**
**අශ්‍රුත්වා පරතඃ ස්පෘශයමමෘතං ප්‍රත්‍යෙකබොධිං ශිවාං**
**බුද්ධත්වං යදි චෙප්සිතං ත්‍රිභුවනෙ පූජේත්වසෞ නායකං**[22]

යන්නෙහි ''**සර්වකිලෙශ බන්ධනලතාං ඡෙත්තුං**'' යන යෙදුම මනරම්, රසවත් අරුත් බර යෙදුමකි. මේ පැදියෙන් නිර්වාණ සාධනයට යමෙක් ප්‍රත්‍යෙක බෝධිය හෝ බුද්ධත්වය පතයි නම් ඔහු බෝධිසත්වයන්ට පූජා පැවැත්වීමෙන් තත් කාර්ය සිද්ධියට පත්වන බව පැවසේ. මෙලෙස ලොව ම උත්තරීතර කරන පුද්ගලයා බෝධිසත්ත්වයන් බවට පත් කොට ඔහු සමස්ත ලෝකයාගේ හදවත් නමැති පූජාසනය මත පිහිටුවාලයි. මෝක්ෂ සාධනය සඳහා පමණක් නොව, බුද්ධ, ප්‍රත්‍යෙක බුද්ධ වැනි උත්තරීතර පදවි ප්‍රාප්ති සාධනය ද බෝධිසත්වයන් කෙරෙහි පූජෝපහාර කිරීමෙන් ම සිද්ධ වන්නකි. බුද්ධ ප්‍රත්‍යෙක බුද්ධ පදවි ඉක්මවා ගිය උත්තරීතර ස්ථානයක බෝධිසත්වවරයා පිහිටුවාලීම ලලිත විස්තරයෙහි මහායානික ආභාසයේ තරම හෙළිදරව් කරයි. සාංසාරික පූරිත පාරමිතා පිළිබඳ පුනරාවර්ජනයක් කරන වසවර්ති මාරයා මෙලෙස කාව්‍යාත්මක වූ ප්‍රශස්ති කථනයක නියැලෙයි.

මීළඟට උත්බල, සුත්බල, ප්‍රජාපති, ගුරබලාදි බෝමැඩ පරිපාලිත සොළොස් දිව්‍ය පුත්‍රයන් රන්වන් මිණි කිංකිණි ජාලාවන්ගෙන් හා දඹරන් පද්මයන් බෝමැඩ අලංකාර කළ අයුරු කවියා ඉදිරිපත් කරන්නේ ප්‍රණීත ආහාරයකින් තෘප්ත වන ළදරුවෙකු සේ ය. බෝධිවෘක්ෂ දේවතාවෝ ශ්‍රී මහා බෝධිය මැවූ අයුරු මනබන්ධනීය අයුරින් වර්ණනා වේ.

**යාන් දෘෂ්ට්වා දෙවනාගයක්ෂගන්ධර්වාසුරාඃ ස්වභවනානි ශ්මශාන සංඥා මුත්පාදයාමාසුඃ**[23]

බෝධිමණ්ඩ පරිපාලක දෙවියන් මැවූ බෝමැඩ අසල ආශ්චර්යමත් පරිසරයෙන් කුල්මත් වූ දේව, නාග, යක්ෂ, ගාන්ධර්ව, අසුරයෝ ස්වකීය භවනයන් අමුසොහොන් සේ සිතූහ. ස්වාභාවික වූ සුපිහිටි

බෝධිද්‍රැමය කෘත්‍රිම දේව නිර්මිතයක් ලෙසින් දක්වීම වර්ණනාවේ සීමාව ඉක්මවා යෑමකි. සැබැවින් ම ප්‍රශස්තියක් තුළින් යථාර්ථවාදි චරිත නිරූපණයක් අපේක්ෂා කළ නොහැක.

කාව්‍යාත්මක ගුණයට උචිත පාරිසරික ව්‍යුහයක් නිර්මාණය කර ගැනීම වර්ණනය කරනු ලබන කථානායක චරිතාපදානයේ සෞන්දර්යට හේතු වේ. සාමාන්‍ය මිනිසාගේ චින්තන සීමාව ඉක්මවා ගිය අපූර්වතම වූ ලෝකයක් බෝමැඩ අවට දේව නිර්මිතයක් ලෙසින් ඇතුළත් කොට ඇත්තේ හුදෙක් බෝධිසත්වයන්ගේ උත්තරීතරත්වය හුවා දැක්වීම සඳහා ම ය. ශක්‍ර , බ්‍රහ්ම වැනි ලෝක පාලකයෝ පමණක් නොව සෙසු බෝසත්වරු ද බෝසතුන් උදෙසා පූජෝපහාර දැක්වූහ.

මුතුපටක ඇමුණූ පබළු පන්තියක් සේ මනා ව සුසංයෝගී වූ පදමාලාවක් ප්‍රයෝජනයට ගනිමින් බෝසතුන්ගේ ශරීරයෙන් විහිදී ගිය රශ්මි මාලාවේ ආනුභාවයෙන් භුවනත්‍රයේ සිදුවන අපූර්ව සිද්ධි මාලාවක් ලලිත විස්තරය ගෙනහැර පායි. **යෙ ච සත්ත්වා විකලෙන්ද්‍රියා අභූවන්, තෙ සර්වෙ පරිපූර්ණෙන්ද්‍රියතාමනුප්‍රාප්නුවන්, ව්‍යාධිතාශ්ච ව්‍යාධිභ්‍යො ව්‍යමුච්‍යන්ත. භයාර්දිතාශ්චාශ්වාස ප්‍රාප්තා අභූවන්. බන්ධනබද්ධාශ්ච බන්ධනෙභ්‍යො ව්‍යමුච්‍යන්ත...**[24] ඉන්ද්‍රිය විකල සත්වයෝ ඉන්ද්‍රිය සම්පූර්ණ බවට පත්වෙති. කොරු ඇවිදිති. ගොලුවෝ කථා කරති. රෝගී වූවෝ නිරෝගී වූහ. පිපාසිත වූවෝ, කුසගින්නෙන් පෙළුණු අය ඒවායින් මිදී සැනසීමට පත්වූහ. ගැබිණියෝ සැපෙන් වැදූහ. මෙබඳු හාස්කම් සිදුවූයේ මහ බෝසතුන්ගේ පින් මහිමය නිසා ය. ''**ලභිංසු අන්ධා විමලෙ විලොචනෙ - සුණිංසු සද්දෙ බධිරාපි ජාතියා ..**'' යනාදි පරිදි බුද්ධත්වයෙන් පසු ඇති වූ ලොවේ අසිරිය පාළි වංශකථාවන්හි මහා ඉහළින් වර්ණනා කර ඇත. ලලිත විස්තරයෙහි මෙලෙස සම්බුද්ධ ප්‍රාප්තියට පූර්ව බෝධිසත්වයන් පිළිබඳ ඒ හා සමාන වර්ණනාවක් හමු වේ. ගද්‍යයෙන් බෝසත් ගුණ වර්ණනා කොට සෑහීමකට පත් නොවන මේ ලලිත විස්තර කතුවරයා කියූ දෙය ම නැවත පද්‍යයෙන් ද කියයි.

**උන්මත්තාඃ ස්මෘතිමන්තශ්ච - දරිද්‍රා ධනිනස්තථා**
**ව්‍යාධිතා රොගනිර්මුක්තා - මුක්තා බන්ධනබද්ධකාඃ**

**න ඛිලං න ච මාත්සර්යං - ව්‍යාපාදො න ච විග්‍රහඃ**
**අන්‍යොන්‍යං සංප්‍රකුර්වන්ති - මෛත්‍රචිත්තා ස්පීතාස්තදා** [25]

එය හුදෙක් බෝධිසත්වයන් පිළිබඳ ගුණ කථනයෙහි තෘප්තිමත් භාවයට කතුවරයාට පත්වීමට තිබූ අපහසුතාව ඉස්මතු වන අවස්ථාවකි. සමස්ත ලෝකයෙහි ම අවියෙන් නොව පින් මහිමයෙන් ම, කාන්තියෙන් ම, මෛත්‍රියෙන් ම අසහාය ආධිපත්‍යයට පත් වූ උතුමෙකු පිළිබඳ කදිම ආදර්ශක මූර්තිය නම් මේ බෝසත් චරිතයයි.

**එවමුදානං චොදනයාමාසුඃ** යන්න ප්‍රස්තුතයෙහිලා වැදගත් වේ. යථෝක්ත සමස්ත අසිරිය හමුවේ සකල ලෝකයා පුදුමයට පත් වී පුණ්‍ය විපාකයේ මහිමය අචින්ත්‍ය යැයි කියා උදන් ඇනූ බව මින් පළට වේ. ඔවුහු අද්භූත ආශ්චර්යෙන් කුල්මත් ව උදන් ඇනුවේ බෝසතුන් පිළිබඳ දොහොත් මුදුනත බැඳගත් හෘදජ භක්ති ප්‍රණාමයෙනි.

**මාතුඃ පිතුශ්චෛකපුත්‍රෙ යථා ප්‍රෙම ප්‍රවර්තතෙ**
**තථාන්‍යොන්‍යෙන සත්තවානාං පුත්‍රප්‍රේම තදාභවත්** [26] යන පද්‍යයෙන් සියලු සත්වයන් ඔවුනොවුන් පිළිබඳ මව්පිය හැඟීමෙන් කටයුතු කළ බව සඳහන් වේ. ඒ තුළින් සමස්ත ලෝකයා එසමයෙහි රාගික ක්ලේශ බන්ධනයෙන් සපුරා මුක්ත ව ගත කළ බව පැවසේ. මෙලෙස එසමයෙහි සත්වයා ආධ්‍යාත්මික හෙවත් මානසික මෙන් ම කායික වශයෙන් ද සැනසුන බව විස්තර වේ. බෝසතුන්

බුද්ධත්වයට පත් වූ පසු ලොවට ඇති වන ශාන්තිය පිළිබඳ පූර්ව නිමිති කථනයක් ලෙසින් යථෝක්ත කාව්‍යාත්මක ප්‍රශස්ති භාෂණය හැදී වැඩී විකසිත ව ඇති බව කිව හැකි ය.

**කාලික නාගරාජ බෝධිසත්ව ප්‍රශස්තිය**

බෝධිසත්ව රශ්මි මාලාවෙන් හර්ෂ ප්‍රමෝදයට පත්වන කාලික නාග රාජයා,

**ශීඝ්‍රං ගෘහ්නත නාගපුෂ්ප රුචිරා වස්ත්‍රාං සුගන්ධාං ශුභාං**
**මුක්තාහාරපිනද්ධ තාංශ්ච වලයාංශ්චූර්ණානි ධූපොත්තමා**
**සංගීතිං ප්‍රකුරුධ්ව වාද්‍යවිවිධා භෙරීමෘදඞ්ගෛඃ ශුභෛඃ**
**හන්තාගච්ඡථ පූජනා හිතකරං පූජාර්හ සර්වෙ ජගෙ**[27]

''වහා නාමල් ගනිව්, ශෝභමාන සුවඳ වස්ත්‍ර ගනිව්, මුතුහර ද වළලු ද පළඳිව්, මිහිඟු බෙර වයව්, මුළු ලෝකයෙහි පූජාර්හ වූ අභිවෘද්ධිකාරකයනට පිදීම පිණිස යමව්'' යැයි උස් හඬින් කියා සිටී. මෙලෙස නා රජු බෝසතුන් පිදීමට යෑමට සැරසුණු ආකාරය සාමාන්‍ය භක්තිමතකුගේ චරිත නිරූපණයක් හා සමාන ව දක්වා ඇත. බොහෝ කාලයකින් උදාවන මෙබඳු පුණ්‍යමය අවස්ථාවකින් පින් සලසා ගැනීමට ඔහු හදවතේ උපන් යුහුසුළුභාවය, ශබ්ද සටනාව හරහා ද ඉස්මතු වේ. පද්‍ය රචකයාගේ අවස්ථා නිරූපණය කිරීමේ කෞශල්‍යය මෙන් ම කාව්‍යාත්මක අවස්ථා ඉදිරිපත් කිරීමේ හැකියාව ද එක්තැන් වූ අවස්ථාවක් ලෙස මෙය හැඳින්විය හැකි ය.

මෙහි එන 34 හා 35 යන පද්‍යද්වය ශබ්ද රසයෙන් සමන්විත වේ. කාලික නාග රාජයා,

**යද්වත් කාමරතී විහාය ච සුරාස්ත්වත් පූජනේ'භ්‍යාගතාඃ**
**බ්‍රහ්මා බ්‍රහ්මපුරොහිතාශ්ච අමරා උත්සෘජ්‍ය ධ්‍යානං සුඛං**
**යෙ කෙචිත් ත්‍රිභවෙ තථෛව ච පුරෙ සර්වෙ ඉහාභ්‍යාගතාඃ**
**අද්‍යා භෙෂ්‍යසි වෛද්‍යරාජ ත්‍රිභවෙ ජාතීජරාමොචකො**[28]

''දෙවියෝ කාමරතීන් හැර දමා බෝසතුන් පිදීමට ආහ. අමරණීය වූ බ්‍රහ්මයෝ ද, බ්‍රහ්ම පුරෝහිතයෝ ද ධ්‍යාන සැප හැර දමා බෝසතුන් පිදීමට ආහ. මෙලෙස තුන් ලොව යම් කෙනෙක් වෙත් නම් ඒ සියල්ලෝ ම බෝධිද්‍රැමය කරා පැමිණියහ. ඔබ තුන් ලොව ජාති ජරා දෙකින් මුදවන වෛද්‍යරාජයා වන්නෙහි ය'' යනාදි පරිදි බෝසතුන් වහන්සේගේ මහා පුරුෂත්වය කාව්‍යාත්මක ව පවසයි. කාලික නා රජු බෝසතුන් දැක්මේ අභිරුචියෙන් පෙළුණෙකි. ඒ අවස්ථාව දූන් උදා වී ඇත. එයින් හදවතේ නැගෙන භක්තියට සීමාවක් නැත. ඔහු බෝධිසත්වයන් වහන්සේගේ ප්‍රතාපත් බව වර්ණනා කරමින් බුද්ධත්වයට පත්වීමේ ඇති පරිපූර්ණ වූ ශක්‍යතාව පිළිබඳ ව දිගින් දිගට ම කවියෙන් ම පවසයි. බෝධිසත්වයන් පිදීමට එන ඔහු මෙලෙස පූජෝපහාර දැක්වීමට කලින් බෝධිසත්ව ගුණයෙන් පිරිපුන්, කාව්‍යාත්මක වූ ද ප්‍රශස්ති භාෂණයක නියැලෙයි.

**වෘක්ෂසපත්‍රපුෂ්පසඵලා, කුම්භසහස්‍රපූර්ණසලිලා, අද්‍යා භෙෂ්‍යසි සාර්ථවාහු ත්‍රිභවෙ ජාතිජරාමොචකො, සාධුදර්ශිතු. පූර්ණචන්‍ද්‍රවදනෙ**[29] යනාදි තැන්හි ඇතුළත් අදහස්වල පිරිපුන් බව පමණක් නොව, භාවිත කාව්‍යාත්මක භාෂාවේ ද පරිපූර්ණ බවක් දක්නට ලැබේ.

**නක්ෂත්‍රා සශශී සතාරකරවී භූමෞ පතෙදම්බරාත්**

**ස්වස්ථානාච්ච චලෙන් මහාගිරිවරඃ ශුෂ්‍යෙදථොසාගරඃ...**[30] චන්ද්‍ර සූර්ය තාරකාවන් අහසින් බිමට වැටීම, මහාමේරු පර්වතය පිහිටි තැනින් ගිලිහීම, සාගරයෙහි වියළීම යන සිද්ධි විය හැකි ය. එහෙත් බෝසතාණන් බුදු වී මිස බොධිද්‍රුමයෙන් නොනැගිටින්නේ ම ය යැයි සපථ කරන කාලික නා රජු ස්වකීය භක්ති ගායනය සමාප්ත කරයි.

**සුවර්ණප්‍රභාසාවගේ ප්‍රශස්ති ගීතාවලිය**

කාලික නා රජුගේ අගමෙහෙසිය වූ සුවර්ණ ප්‍රභාසාවගේ ස්තුති පූර්වක සමස්ත පද්‍යාවලිය පරිපූර්ණ ප්‍රශස්තියක් වේ.

**අභ්‍රාන්තා අත්‍රස්තා අභීරූ අජම්භී**
**අලීනා අදීනා ප්‍රහෘෂ්ටා දුධර්ෂා**
**අරක්තා අදුෂ්ටා අමූඪා අලුබ්ධා**
**විරක්තා විමුක්තා නමස්තෙ මහර්ෂෙ**[31] යනාදි පරිදි නමස්කාරයෙන් අරඹා තම හදවතේ උපන් භක්තිමත් වූ හැඟීම් සරල ව පද්‍යයෙන් පවසයි. අනුප්‍රාස අලංකාරය යොදා ගනිමින් කෙටි වැකි භාවිත කරමින් බෝසතුන්ගේ ගමන මෙහි දී චිත්ත රූපයකට නැගූ අයුරු මනහර ය.

''භ්‍රාන්තියට නොපත්, ත්‍රස්ත නොවූ, බියසුලු නොවූ, තැති නොගන්නා වූ, නොසැඟ වූ, දීන නොවූ, ප්‍රීතියට පත්, නොමැඩිය හැකි, ද්වේශයෙන් නොඇලුණු, දුෂ්ට නොවූ, මෝහයෙන් මුලා නොවූ, ලෝභ නොවූ, විරාගී වූ, කෙලෙසුන්ගෙන් මිදුනා වූ ඔබට නමස්කාර වේවා.'' මෙලෙස බුදුවරයෙකු සතු මෙකී ලක්ෂණ එනම් විරාග, නික්ලේශී ආදි ගුණ බෝසත්වරයෙකු හා සම්බන්ධ ව දැක්වීම නිසා බෝසතුන් තුළින් බුදුරදුන් මූර්තිමත් කිරීමට ගත් ප්‍රයත්නයක් ඉස්මතු වේ. ලලිත විස්තරයෙහි බෝසතුන් හා බුදුරදුන් අතර වෙනසක් සලකා ඇති බවක් පෙනෙන්නට ද නැත.

**භිෂඩ්කා විශල්‍යා විනෙයා විනෙෂී**
**සුවෛද්‍යා ජගස්‍යා දුඛෙභ්‍යඃ ප්‍රමොචී**
**අලෙනා අත්‍රාණා අභීනා විදිත්වා**
**භවාලෙනු ත්‍රාණො'ත්‍රිලොකෙ'ස්මි ජාතඃ**[32]

සුවර්ණ ප්‍රභාසා, බෝසතාණෝ රාගාදි උල් නැති කළ, විනේය ජනයන් හික්මවන, ලෝකයාට මහා වෙදදුරෙකු වූ ලෝකයා දුක්වලින් මුදන, තුන්ලොවට අසහාය නාථයන් ලෙසින් දකියි. මින් පළට වන්නේ බෝසතාණන් වහන්සේගේ අතිමානුෂීය වූ ආධ්‍යාත්මික ගුණ රශ්මියේ ප්‍රභාවයි. සරල මෙන් ම, ශබ්දාර්ථ රසානුන ආකස්මික ව ගලා යන පද්‍යයෙහි පදවැල බෝසත් ප්‍රතිමූර්තියක් පාඨක නේත්‍රාභිමුව මැවෙන කාව්‍යාත්මක වූ සංකල්පනාවෙන් පෝෂිත ව ඇත. සුවර්ණ ප්‍රභාසාව පද්‍ය පන්තියකින් ස්වකීය හෘදජ භක්ති පුෂ්පයෙන් බෝසතුන් වැඳ, සම්බෝධිය සඳහා උත්සුක බස් තෙපලමින් ස්වකීය පූජෝපහාර දැක්වීම කෙළවර කළා ය.

සම්බෝධි ඵලාපේක්ෂිත බෝසතාණන් ස්වකීය ආසනය සඳහා තණ කපමින් සිටි ස්වස්තික නම් යාවසිකයා අමතයි. බෝසතාණන්ගේ මුවින් වැගිරෙන වාග්මාලාව **ශ්‍රවණීයා ස්නිග්ධා ස්මරණීයා චොදනී, තොෂණී, ප්‍රෙමණී, අකර්කසා, අගද්ගදා, අපරුෂා, අචපලා, ශ්ලක්ෂණා, මධුරා, කර්ණසුඛා**[33] යනාදි වශයෙන් ස්වාර්ථවත් ව, සුමනොඥ ව, සුමිහිරි ව, සුපෝෂිත ව ඇත. පෙළ දහමෙහි බුදු හිමියන්ගේ වචනය සතු මේ මහිමය ලලිත විස්තරයෙහි බෝසතුන් තුළින් දකියි. මාර බලය අබල කරන, මොක්ෂ මාර්ගය දක්වන, ගැඹුරු වූ, සෞම්‍ය වූ වදනින් අමතන බෝසතුන් යාවසිකයා දුන් තෘණ ලැබ, **මමෙව සිංහාසනෙ බොධිසත්ත්වො නිෂණ්ණො නාන්‍යෙෂාමිති.**.[34] මාර බලය මර්ථනය කරන, අමෘතය ස්පර්ශ කරන, සිංහයකු සේ සිංහාසනයෙහි වැඩ සිටි බෝසත් තෙමේ අනුන්ගේ සිංහාසනයක නොවේ යන ආකල්පය දෙවිවරුන්ට ඇති වන පරිදි බෝසතුණන් රූපකාය විවිධ ස්ථානවල මවන ලදී. එය විශ්මයාවහ කරුණකි. බෝසතුන් ප්‍රාතිහාර්ය පෑමේ සමත් වූ බව මින් ගම්‍ය වේ.

මෙලෙස බෝධිමණ්ඩ ගමන පරිවර්තය බෝසතුන්ගේ ගුණ මහිමය කියාපාන්නට ම සුසැදුණකැයි මනා ව විශද වේ. බෝසතුන් පිළිබඳ ගද්‍ය හා පද්‍ය මාධ්‍යද්වයෙන් ම වචන සිතුවම සජීවී බවින් ආවේශ ව ඇත. කාව්‍යාත්මක වූ වර්ණනා රීතිය පාඨක හදේ බෝධිසත්ව ගුණයන් පිළිබඳ ප්‍රතිමූර්තියක් නිමවීමට තරම් සමත් උසස් ගුණයෙන් යුක්ත ය. මෙලෙස ගැදි පැදි මනහර බසින් සාලංකෘත කාව්‍යාත්මක වූ භාෂා ශෛලිය, බෝසතුන්ගේ අසීමිත මහා පුරුෂත්වය සමග මුසු ව ප්‍රශස්ති පූර්වක භක්ති වන්දනාක් බෝධිමණ්ඩ ගමන පරිවර්තය තුළ ගොනු වී ඇති බව කිව හැකි ය.

**බෝධිමණ්ඩ ව්‍යුහ පරිවර්තය තුළ බෝසත් චරිත නිරූපණය**

බෝමැඩ වැඩ හුන් බෝධිසත්වයන්ගේ ආරක්ෂාව සඳහා සදිසාවෙන් ම දෙවියන් රැකවල් ලා සිටි බව පවසමින් බෝධිමණ්ඩ ව්‍යුහ පරිවර්තය කතුවරයා අරඹයි. **බෝධිසත්ත්වසංචොදනී** නම් රශ්මියක් විහිද වන බෝසතුන්ගේ පිළිරුව සමස්ත ලෝකවාසීන්ට ම දර්ශනය වූ බව මෙහි සඳහන් වේ. යථෝක්ත රශ්මියෙන් පිබිදෙන තථාගතයන් වහන්සේලා බෝධිසත්වයන්ට පූජෝපහාර දක්වීමට පැමිණෙති. තථාගත බුදුවරයන් වහන්සේලා බෝසතුන්ට පූජෝපහාර දක්වීමට පැමිණි බව පැවසීම මහායානික ආභාසයෙහි තරම කියාපායි. බෝධිමණ්ඩව්‍යුහ පරිවර්තය පුරාවට සකල ලෝකවාසී බෝධිසත්වවරු සිදුහත් බෝධිසත්වයන්ට පූජෝපහාර දක්වීමට පැමිණි ආකාරයත්, ඔවුන් බෝසතුන් පිළිබඳ ගැයූ ගුණ ගායනාත් දක්නට ලැබේ.

රත්න ව්‍යුහ නම් ලෝක ධාතුවෙන් එන රත්න ඡත්‍රකූට සන්දර්ශන නම් බෝසත් තෙමේ බෝසතුන් පිළිබඳ ප්‍රශස්ති ගුණ ගායනයක යෙදෙයි. මෙලෙස සූර්යාවර්ත, ගුණාකරා, රත්නසම්භවා, මෙඝවත, හේමජාල ප්‍රතිච්ඡන්නා, සමන්ත විලොකිතා, මරගගනා ආදි ලෝක ධාතුවලින් පැමිණෙන, ව්‍යුහරාජ, ගුණමති, රත්නසද්භව, රත්නගර්භ, ගගනගඤ්ජ ආදි බෝසත්වරු බෝසතුන් පුදා ප්‍රශස්ති ගායනයක් සිදු කළහ. ඒ සෑම භාෂණයක් ම කාව්‍යාත්මක වීම මෙහි දී සුවිශේෂ ලක්ෂණයකි. කෙසේ වුවත් මෙම බෝධිසත්ව වන්දනාව දශ පාරමිතාවන්හි විපාක දීමේ අසිරිමත් බව හෙළි කරන්නේ යැයි කිව හැකි ය. සාංසාරික වශයෙන් බෝසතුන් පූරණය කරන ලද පුණ්‍යකර්මයන් අනුස්මරණ ව්‍යාජයෙන් සෑම පද්‍යයක් ම සාලංකෘත ව තිබීම ඊට හේතුවයි.

**ත්‍යක්තා යෙන සසාගරා වසුමතී රත්නාන්‍යථො'නෙකශඃ**
**ප්‍රාසාදාශ්ච ගවාක්ෂහර්මිකවරා යුග්‍යානි යානානි ච**
**ව්‍යොමාලංකෘත පුෂ්පදාම රුචිරා උද්‍යානකූපා සභා**
**හස්තාපාද ශිරොත්තමාඞ්ගනයනාඃ සො බොධිමණ්ඩ ස්ථිතඃ**[35] යනාදි පරිදි සාගරය සහිත ව පෘථිවිය ද නේක විධ රත්නයන් ද, මහාප්‍රාසාද, අශ්ව යානාදිය ද, අලංකෘත උයන් ද, ළිං ද, භෝජන

ශාලා, විශ්‍රාම ශාලා ආදි භෞතික සම්පත් පමණක් නොව, අත් ද, පා ද, හිස් ද යන ශාරීරික අවයවයන් ද පිදූ බෝසතුන් උදෙසා පූජෝපහාර දක්වන බව පැවසේ.

**ධර්මාමෙඝ ස්ඵුරිත්ව සර්වත්‍රිභවෙ විද්‍යාමුක්ති ප්‍රභඃ**[36] යනාදි පරිදි තුන් ලොව දහම් වැස්සෙන් තෙමා ලූ, විරාගී වූ, රාගක්ලේශ බන්ධන සිඳින, ධ්‍යාන, ඍද්ධි යනාදි බලයන්ගෙන් කුසුමිත වූ ශ්‍රද්ධා ආකාරයක් ලෙස බෝසතුන් හැඳින්වේ. මෙලෙස සෑම පදවැලක ම බෝධිසත්වයන්ගේ බාහිර මෙන් ම ආධ්‍යාත්මික වූ ද ගුණ සන්තතිය ඇමිණී ඇත. බෝසත්වරුන් ම සිදුහත් බෝසතුන් පිළිබඳ ව ගුණ ගායනා කිරීම අවධානය යොමු කළ යුත්තකි. සෑම කෙනෙක් ම බුද්ධාංකුර හෙවත් බෝධිසත්වවරුන් ලෙස පිළිගැනීම මහායානික ආකල්පයයි. යථෝක්ත මහායානික ප්‍රවණතාව බෝධිමණ්ඩව්‍යුහ පරිවර්තය තුළ දක්නට ලැබේ.

බොධිද්‍රැමයෙහි වැඩ සිටින බෝසතුන් පිදුමට විවිධ බෝසත්වරු පැමිණෙති. ඔවුහු මහපොළොව දෙදරවමින්, අහස ගුගුරවමින්, නොයෙක් අචින්ත්‍ය වූ නිර්මිතයන් මවා බෝසතුන් උදෙසා පූජෝපහාර දක්වූ අයුරු මෙහි විස්තර වේ. ඇතැම් බෝසත් කෙනෙක්,

**කෙ චාගතා රවිරිව ප්‍රභමුඤ්චමානාඃ**
**සර්වාණි මාරභවනානි කරොන්ති ජිහ්මා**
**කෙ චාගතා විමලකේතු යථෛන්ද්‍රයෂ්ට්‍යඃ**
**සංභාරපුණ්‍යනිචිතාස්තහි බොධිමණ්ඩෙ**[37]

සූර්යයා මෙන් ප්‍රභාවන් විහිදුවමින් සියලු මාර භවයන් වකුටු කරමින් ආහ. ඒ අතර ඇතැමෙක් දෙපයින් දෙරණ කම්පා කරමින් ආහ. සමහර බෝසත්වරු මහමෙර අත්තලින් ගෙන අන්තරීක්ෂයෙහි මල් ගුළාවක දැමූහ. මෙලෙස මහත් අසිරියක් බෝමැඩ අසල බෝසත්වරු මවති. ඒ බෝසත්වරු,

**කෙ චාගතා රචිත කින්නර තුල්‍යඝොෂාඃ**
**බිම්බොෂ්ඨචාරවදනාඃ පරිපූර්ණ වක්ත්‍රාඃ**
**කන්‍යා යථෛව සුඅලංකෘත චිත්‍රහාරාඃ**
**ප්‍රෙක්ෂන්ත යාං සුරගණා න ලභන්ති තෘප්තිං**[38]

කිඳුරු නාදයට සමාන හඬ ඇත්තාහු ය. බිඹු ඵලවන් අදරයෙන් අලංකෘත මුව ඇත්තාහු ය. පිරිපුන් මුහුණ ඇත්තාහු, කන්‍යාවන් මෙන් ස්වාලංකෘත විචිත්‍ර මාලදාමාදියෙන් හොබනාහ. මෙවන් අසිරියෙන් සුසැදි බෝසත්වරුන් දකින දිව්‍ය සමූහයාගේ සිත තෘප්තියට පත් නොවේ. අද ම නිවන සිදුහත් බෝසතුන් අවබෝධ කර ගන්නේ ය යන්න ප්‍රතිරාවය කරනු වස් මෙලෙස බෝසත්වරු විවිධ ඓශ්වර්යන් මැවූ බව පවසමින් බෝධිමණ්ඩව්‍යුහ පරිවර්තය අවසන් වේ.

ගද්‍ය පද්‍ය සන්නිධියෙන් සැදුණු සරල බස් වහරකින් ලලිත විස්තර භාෂා ශෛලිය සුසැදී ඇත. විවිධ විරිත් ඔස්සේ කාව්‍යාත්මක සංකල්පනාවන් පාඨක හෘදයේ ජනිත කිරීමට තරම් ඒ බස් වහර ප්‍රාණවත් ය. අශ්වඝෝෂ හිමියන් ස්වකීය කාව්‍ය ප්‍රතිභාවේ මහිමයෙන් මෙලෙස බෝසත් චරිත වර්ණනාවක නිමග්න වේ. එය සැබැවින් ම බෝසත් චරිතය පිළිබඳ තවත් එක් මහාකාව්‍යයක් නොවේ. එහෙත් ඊට අවශ්‍ය සෑම අංගයකින් ම සුපෝෂිත ව ඇති භක්ති ගීතිකාවකි. **බෝධිමණ්ඩගමන** හා **බොධිමණ්ඩව්‍යුහ** පරිවර්තද්වය ප්‍රස්තුතයානුකූල ව අධ්‍යයනයේ දී ඒවා හුදෙක් බෝසත් චරිතය පිළිබඳ භක්තියෙන් නැමී ගිය හදවතින් උපන් විශුද්ධ සංකල්පනාවන්ගෙන් පරිපූර්ණ ව ඇති බව කිව හැකි ය. බෝසතුන් පිළිබඳ බුදුරදුන් ද අභිභවා ගිය උත්කෘෂ්ට වර්ණනාවක් යථෝක්ත පරිවර්තයන්හි ඇතුළත්

වේ. සෑම පදවැලක් ම බෝසත් චරිතය සතු අනන්ත මහාපෞරුෂයෙන් අලේපිත ව ඇත. මේ අනුව පෙළ දහමේ එන මානුෂික තත්ත්වයත්, සද්ධර්මපුණ්ඩරීකාදියෙහි හමුවන අතිමානුෂීය, සපුරා දිව්‍යමය තත්ත්වයත් අතර අවස්ථාවක් බුද්ධ චරිතය පිළිබඳ ව ලලිත විස්තරයෙහි සංග්‍රහ වන බව සුවිශද වේ.

**පාදක සටහන්**

01. ලලිත විස්තරය, 1 පිටුව
02. එම, 5 පිටුව
03. එම, 88 පිටුව
04. එම, 120 පිටුව
05. එම, 125 පිටුව
06. එම, 126 -127 පිටු
07. එම, 36 පිටුව
08. එම, 36 පිටුව
09. එම, 36 පිටුව
10. එම, 36 පිටුව
11. එම, 36 පිටුව
12. එම, 37 පිටුව
13. එම, 37 පිටුව
14. එම, 37 පිටුව
15. එම, 37 පිටුව
16. එම, 37 පිටුව
17. එම, 38 පිටුව
18. එම, 38 පිටුව
19. එම, 38 පිටුව
20. එම, 40 පිටුව
21. එම, 40 පිටුව
22. එම, 40 පිටුව
23. එම, 42 පිටුව
24. එම, 43 පිටුව
25. එම, 44 පිටුව
26. එම, 44 පිටුව
27. එම, 47 පිටුව
28. එම, 49 පිටුව
29. එම, 48 - 49 පිටු
30. එම, 50 පිටුව
31. එම, 51 පිටුව
32. එම, 52 පිටුව
33. එම, 52 පිටුව
34. එම, 55 පිටුව
35. එම, 61 පිටුව
36. එම, 62 පිටුව

37. එම, 64 පිටුව
38. එම, 66 පිටුව

**ආශ්‍රිත ග්‍රන්ථ**


1. ලලිත විස්තරය, කථිකාචාර්ය, පූජ්‍ය රතනසාර මාරඹ නාහිමි, 1961, විද්‍යාලංකාර පර්යේෂණ ආයතනය, කැලණිය.

2. ශූන්‍යතා දර්ශනය, පණ්ඩිත හේන්පිටගෙදර ඥාණසීහ හිමි, 1969, රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ.
3. පන්හිඳ - (සාහිත්‍ය හා දාර්ශනික විමසුම්), පූජ්‍ය ඇත්කඳුරේ සුමසාර හිමි, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන පාර, කොළඹ 10.
4. ප්‍රඥාඤ්ජල, ශාසන සේවක සමිතිය, 1988, මහරගම.
5. ශාස්ත්‍රීය සංග්‍රහය, 1972, ශ්‍රී ලංකා විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය, කැලණිය.
6. A History of Sanskrit Literature, by Berriedale Keith, 1928, Oxford Unversity Press, London.
7. Literary History of Sanskrit Buddhism, by U. K. Nariman, 1919.
8. History of Indian Literature, by Naurice Winternitz, 1999, Motoilal Banarsidass Publications Private LTD., Delhi.



**කථිකාචාර්ය,**
**පූජ්‍ය උඩවෙල රේවත හිමි,**
**රාජකීය පණ්ඩිත, ගෞරව ශාස්ත්‍රවේදී(කැලණිය),**
**කොරියන් භාෂා ඩිප්ලෝමා (කැලණිය)**
**සංස්කෘත අධ්‍යයනාංශය,**
**කැලණිය විශ්වවිද්‍යාලය,**